# අනගාරික ධර්මපාලතුමා සහ අමද්‍යප ව්‍යාපාරය

**මහාචාර්ය ආර්.එච්.ආර්. ගුණවර්ධන**
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

අමද්‍යප ව්‍යාපාරයේ ආරම්භය සිදුවන්නේ බ්‍රිතාන්‍ය යුගයේ දී ය. එකල රජයේ සුරාබදු පිළිවෙතට විරුද්ධව බෞද්ධ නායකයන් ගෙනගිය දේශීය ව්‍යාපාරයක් ලෙසත් මෙය හැඳින්විය හැකියි. අතීතයේ දී හුදෙක් තම තමන්ගේ ජීවිතයේ විනෝදය, ආස්වාදය උදෙසා මත්පැන් පානය සිදුවිය. නමුත් මේ සඳහා රාජ්‍ය මැදිහත් වීම එකල නොතිබිණ. පෘතුගීසීන් මෙරට පාලනය කළ වකවානුවේ දී ඔවුන් විවිධ ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමු කළේ ය. විශේෂයෙන් මත්පැන් වෙළඳාම අලෙවිය පිළිබඳ ඔවුන්ගේ අවධානය විශේෂ විය. ඔවුන් මුල්වරට රජයේ ආදායම් මාර්ගයක් ලෙස මත්පැන් වෙළඳාම ආරම්භ කළේ ය. දහසය සහ දහහත් වන සියවස් වල ලංකාවේ නිරිතදිග ප්‍රදේශවල පොල් වගාව ව්‍යාප්ත විය. පොල් වගා නිෂ්පාදනවල එක් අතුරු නිෂ්පාදනයක් ලෙස රා නිපදවීම ආරම්භ විය. එනිසා පෘතුගීසීන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට මෙය පත්විය. පෘතුගීසීන්ට වඩා විධිමත් ලෙස ලන්දේසීන් මත්පැන් අලෙවිය පවත්වා ගෙන ගියේ ය. පසුව බ්‍රිතාන්‍ය පාලනයේ දී මත්පැන් අලෙවිය රාජ්‍ය පාලනය යටතේ කදිම ආදායම් මාර්ගයක් ලෙස ව්‍යාප්ත විය. මොවුන් විධිමත් අයුරින් මත්ද්‍රව්‍ය වෙළඳාම සිදු කළේ ය. 1834 සුරාබදු පනතත් 1844 දී අංක 10 දරණ පනතත් මීට දායකත්වය ලබා දුන්නේ ය. මෙම පනත මගින් බලය ලත් තැබෑරුම් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි. මේ ආකාරයට බලපත්‍ර සහිත තැබෑරුම් දිවයින පුරා ව්‍යාප්ත විය. සිල්ලර හා තොග වෙළඳාම් රජයේ පාලනය යටතේ විය. රා අරක්කු පෙරීම රජයේ ඒකාධිකාරයක් බවට පත්විය. මෙම බලපත්‍ර ඒ ඒ ප්‍රදේශවල ඒජාන්තවරු මාර්ගයෙන් ක්‍රියාත්මක විය. ඒ සඳහා ඔවුන් යොදා ගත් ක්‍රමය වූයේ වෙන්දේසි ක්‍රමයයි. මේ අනුව 20 වන සියවස වන විට රා අරක්කු වෙළඳාම හා එයින් ලැබුණු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට පත්විය. ඊට සාපේක්ෂව රටේ මත්පැන් තැබෑරුම් ශීඝ්‍ර ලෙස වර්ධනය වූ අතර පාරිභෝගිකයන්ගේ ද වැඩිවීමක් සිදුවිය. රටේ උණුසුම්කාරී වාතාවරණයක් නිර්මාණය වීමට බලපෑ පනතක් ලෙස 1912 අංක 08 දරණ සුරාබදු පනත හැඳින්විය හැකිය. මෙයින් සිදු වූයේ සුරාබදු ආදායම් මාර්ගය විධිමත් ලෙස ප්‍රතිසංස්කරණය වීමය. ඒ පනතින් විවිධ නීති රෙගුලාසි පැනවීය. ඒ අනුව රටේ හොර තැබෑරුම් නීත්‍යානුකූල බලපත්‍ර සහිත මත්පැන් ශාලා බවට පත්විය.

එමගින් ශීඝ්‍රයෙන් රටපුරා සුරාසැල් ව්‍යාප්ත විය. සුරාබදු දෙපාර්තමේන්තුව පිහිටුවා සුරාබදු ආදායම විධිමත් කිරීමට පියවර ගන්නා ලදි. වර්ෂ 1900 දී තිබුණු තැබෑරුම්වලට වඩා සිය ගුණයකින් මත්පැන් ව්‍යාප්තිය වර්ධනය විය. මෙයට විරුද්ධව රට පුරා විරෝධතා ව්‍යාපාර

ආරම්භ විය. 19 වන සියවසේ දෙවන භාගයේ දී මෙයට විරුද්ධව විරෝධතා ව්‍යාපාර නැගී ආවේ ය. මෙය සමාජ ව්‍යසනයක් ලෙස දේශීය හා රජයේ ඉහළ නිළධාරීහු ද පෙන්වා දුන්හ. 1872 වසරේ දී ආණ්ඩුකාරධුරය දැරූ විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා පාර්ලිමේන්තුවේ දී කළ කතාවක සඳහන් වූයේ, ගම්බද ජනයා වැඩි වශයෙන් මත්පැන් කෙරෙහි ඇබ්බැහි වෙමින් පවතින බවත්, මරණ දඬුවම පැනවීම සඳහා එතුමා වෙත එවා ඇති අයදුම්පත්‍ර වලින් වැඩි කොටසක් මත්ද්‍රව්‍ය පානයෙන් සිදුවන ක්‍රියා බැවින් ඒ බව ප්‍රත්‍යක්ෂ වන බවත්ය. රජයේ වත්මන් වැඩපිළිවෙළට විරුද්ධව මුලින් ම හඬ නැගුවේ ක්‍රිස්තියානි සංවිධාන මගිනි. මේ යුගය වන විට මිෂනාරි සමාගම් ගණනාවක් ඔවුන්ගේ ආගමික හා අධ්‍යාපනික කටයුතු සඳහා මුල පිරීය. විශේෂයෙන් සමිති රැස්වීම් මගින් රජයේ වැඩපිළිවෙළ වෙනස් කළ යුතු බවට අදහස් පළවිය. ක්‍රිස්තියානි ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් ලෙස ජෝන් මර්ඩොක් පූජකවරයා කැපී පෙනුණු කාර්යයක් සිදු කළේය. ආචාර්ය ලිස්බෝවා පින්ටෝ තවත් කැපී පෙනුණ චරිතයක් විය. මේවායේ අරමුණ අමද්‍යප සමිති පිහිටුවා තැබෑරුම් සංඛ්‍යාව අඩු කිරීම, ඉරිදා දිනවල තැබෑරුම් වැසීම විය. ඔවුන් පෙන්වා දුන්නේ තැබෑරුම් විවෘත කිරීම සඳහා ප්‍රදේශයේ කැමැත්ත ලබා ගත යුතු බවයි. මෙම ක්‍රිස්තියානි ව්‍යාපාරය දීප ව්‍යාප්ත ආකාරයෙන් සිදු නොවී ය. එයට හේතුව ආගමික නිකායන්ට සීමා වීමයි. මෙය දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් වූයේ බෞද්ධයන් මේ සඳහා සම්බන්ධ වීමත් සමඟ ය. 19 වන සියවස මුල් භාගයේ බෞද්ධාගමික පිබිදීමක් ඇතිවිය. සරණංකර හිමියන්ගේ අනුගාමිකයන් පහතරට ප්‍රදේශයේ බෞද්ධ පුනර්ජීවනය සඳහා ක්‍රියාකාරී මෙහෙවරක් සිදු කළේ ය. පංචමහා වාදයන්ගෙන් ද බෞද්ධ පිබිදීමක් ඇතිවිය. පන්සල් අධ්‍යාපනයේ පිබිදීමක් ද මෙමගින් සිදුවිය. විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් ආරම්භය පන්සල් අධ්‍යාපනයේ ඉදිරි පියවරක් විය. භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීම අමද්‍යප ව්‍යාපාරයේ පිබිදීමට හේතු විය.

වර්ෂ 1880 දී ඕල්කට්තුමාගේ ලංකාගමනය වැදගත් සංදිස්ථානයක් විය. එතුමා පරම විඥාන බෞද්ධ සමාගම ඇරඹූ අතර එහි අරමුණු බවට පත්වූයේ බෞද්ධ පාසල් ආරම්භ කිරීමයි. එයින් බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රබෝධයක් ඇතිවිය. මේ අයුරින් බෞද්ධ ආගමික ප්‍රබෝධය සහ බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධය ඇතිවිය. අනගාරික ධර්මපාලතුමාගේ ආගමනය මෙකල සිදුවිය. මෙතුමා බටහිරකරණයට විරුද්ධව සංස්කෘතිකමය වශයෙන් පුරෝගාමී මෙහෙවරක් සිදු කළේ ය. අනගාරික ධර්මපාලතුමාගේ සමීපතමයා ලෙස වලිසිංහ හරිස්චන්ද්‍ර මහතාගේ ක්‍රියාකාරීත්වය අතිශයින් කැපී පෙනෙන්නක් වීය. ඔවුහු ගවමස් කෑම සහ මත්පැන් පානය බෞද්ධ සිරිත් විරිත්වලට පටහැනි බවත්, දේශීයත්වය ගරු කළ යුත්තක් බවත්, දේශීය චාරිත්‍රවාරිත්‍ර ගරු කළ යුතු බවටත් රට පුරා සැරිසරමින් ජනයා දැනුවත් කළහ. මෙහි පළමු පියවරක් වශයෙන් අමද්‍යප ව්‍යාපාරය හැඳින්විය හැකිය. වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා අනුරාධපුර ප්‍රදේශයේ අමද්‍යප කටයුතු මෙහෙයවා රාජ්‍ය පිළිවෙතට විරෝධය පළ කළේ ය. අනගාරික ධර්මපාලතුමාත් රටපුරා සැරිසරමින් බෞද්ධ සිරිත් විරිත් අගයමින් අවවාද අනුශාසනා දෙමින් අමද්‍යප සමිති සමාගම් පිහිටු වීය. සිංහල බෞද්ධයා පුවත්පත

ආරම්භයත් සමඟ මද්‍යසාර පානයේ ඇති වරද සහ එයින් සිදුවන විපත් පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කළේ ය. "සරසවි සඳරැස" පුවත්පත මගින් රජයේ ක්‍රියාකලාපය විවේචනය කළ අතර, එහි සුවිශේෂී අංගයක් ලෙස අමද්‍යප ව්‍යාපාරය පිළිබඳ අදහස් ද විය. ප්‍රථම සිංහල බෞද්ධ පුවත්පත වන "ලක්මිණි පහන" පුවත්පතින් විශේෂ අවධානය යොමු වූයේ අමද්‍යප ව්‍යාපාරය සඳහා ය. "දිණමිණ" පුවත්පත ද ඒ සඳහා පුරෝගාමී මෙහෙවරක නිරත විය. ප්‍රාදේශීය වශයෙන් ජනයා දැනුවත් කිරීම අනගාරික ධර්මපාලතුමාගේ වැදගත් පියවරක් විය. සුචරිත සමිති සහ බෞද්ධ පාසල් මේ කාර්යයේ දී වැදගත් විය.  ස්වාමීන් වහන්සේලා ගුරුවරු වෙදදුරන් මේ සඳහා පුරෝගාමී මෙහෙවරක නිරත වූහ. මෙම ව්‍යාපාරයට සමගාමීව කොළඹ අමද්‍යප ව්‍යාපාරය නමින් සමාගමක් ආරම්භ විය. අමද්‍යප ව්‍යාපාරයේ නායකත්වයේ වෙනසක් 20 වන සියවසේ දෙවන දශකයේ සිට සිදු විය. මෙතෙක් කලක් අමද්‍යප ව්‍යාපාරයේ නායකත්වය ගත්තේ අනගාරික ධර්මපාලතුමා ප්‍රමුඛ පිරිස් වේ. 20 වන සියවසේ දෙවන දශකයේ සිට මෙම ව්‍යාපාරයට නායකත්වය ගනු ලැබුවේ ඉංග්‍රීසි උගත් මධ්‍යම පාන්තිකයන් විසිනි. බෞද්ධ සමාගම් බෞද්ධ නායකයන් අතර මතවාදීමය විරුද්ධතාවන් අනගාරික ධර්මපාලතුමා හා ඇතිවිය. මේ හෙයින් අනගාරික ධර්මපාලතුමා අමද්‍යප ව්‍යාපාරයෙන් කෙමෙන් ඉවත් වන්නට විය. ඒ අනුව ගිහි බෞද්ධ නායකයෝ අමද්‍යප ව්‍යාපාරයේ නායකයන් බවට පත්වූහ. එමගින් ඔවුනට මහජනයා අතරට ප්‍රවිෂ්ට වීමේ වේදිකාවක් සැලසුණි. සර් ඩී. බී. ජයතිලක, උදේනි ද සිල්වා, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර, සී. ද එස්. කුලරත්න මෙන් ම සේනානායක පවුල ද අමද්‍යප ව්‍යාපාරය වෙනුවෙන් ඇප කැප වී කටයුතු කළහ. 1915 සිංහල මුස්ලිම් කෝලාහලය අමද්‍යප ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයන් මදකට ප්‍රමාද කරන්නට විය. නමුත් 1916 සිට කොළඹ අමද්‍යප මහා සංගමය සමඟ අමද්‍යප ව්‍යාපාරය නැවත ක්‍රියාත්මක වුණි. විශේෂයෙන් 1920, 1924, 1931 මැනිං සහ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ව්‍යවස්ථාදායක සභාවට නිල නොලත් සාමාජිකයන් පත් කිරීම සිදු විය. මධ්‍යම පාන්තික පිරිස විරෝධතා ව්‍යාපාර මගින් දේශපාලන නායකත්වයක් ලබා ගෙන පාර්ලිමේන්තු සභාවට පිවිසිණි. මන්ත්‍රීධුර ලබා ගත් මධ්‍යම පාන්තික ව්‍යවස්ථාදායක සභාව තුළ වැඩි වශයෙන් අවධානය යොමු කළේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා වූ අතර, ඔවුනට අමද්‍යප ව්‍යාපාරය අමතක වූවක් බවට පත්විය. ඉන් අමද්‍යප ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය අඩපණ විය. ඒ අනුව එතෙක් යුහුසුළුව ක්‍රියාකාරී මෙහෙවරක නිරත වූ අමද්‍යප ව්‍යාපාරයේ ගමන් මග අතරමග නතර විය.